

සිදුහත් බෝසතාණන්හට සුජාතා සිටු දේවිය කිරි පිඬු පූජා කිරිම

## ⁂ බුදු නෙත දුටු පුනරුත්පත්තිය හා පුනර්භවය

– පිටිදුවේ සිරිධම්ම හිමි

සත්වයාගේ සසර පැවැත්ම සිදු වෙන ආකාරය පහද දීම සඳහා බුදුරදුන් ඉදිරිපත් කළ පුනරුත්පත්තිය හා පුනර්භවය පිළිබඳ ඉගැන්වීම් විමසුමට ලක් කිරීමකි. විද්‍යාත්මක – මනෝ විද්‍යාත්මක හා මෝහන විද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිඵල ආදිය පිළිබඳ පුනර්භව සංකල්පයට අදාළව නගන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයෙන සාකච්ඡා කොට සකස් කැරුණු ලිපි පෙළකි.

## ⁂ නොමැරෙන මිනිස්සු

– දිවියාගහ යසස්සි නාහිමි

‘සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්’ විශේෂාංගය යටතේ – මෙලොව – පරලොව සුබසිද්ධිය සහ පරම විමුක්තිය ලබාගැනීම සඳහා අත්‍යවශ්‍ය පිළිවෙතක් වශයෙන් බුදු වදනෙන් අවධාරණය වූ – ‘අප්‍රමාදය’ හෙවත් යහපත් සිහියෙන් කටයුතු කිරීමේ වැදගත්කම විග්‍රහ කැරෙන ලිපියකි.

## ⁂ බුදු සිරිතෙන් – බුදු දහමෙන් පිළිබිඹු වන ධනාත්මක චින්තනය

– සුගත් රත්හොටි

ප්‍රතිජානාත්මක හා සුබවාදී ආකල්ප මිනිස් සිත් තුළ වර්ධනය කිරීමෙන් ප්‍රමුදිත සමාජයක් බිහි කිරීමේ නූතන මනෝ විද්‍යාඥයන්ගේ වෑයම හමුවේ – බුදු දහම පුද්ගලයාගේ ලෞකික හා ආධ්‍යාත්මික ප්‍රගතිය සඳහා සිදුවිය යුතු යැයි නිර්දේශ කරන ආකල්ප පෙරළිය කෙබඳු ද’යි හෙළිදරව් කිරීමට මෙම ලේඛකයා උත්සාහ දරා ඇති බව පෙනේ.

## ⁂ Religious conversions

*-by Aryadasa Ratnasinghe*

## ⁂ පුද්ගලයා හා බෞද්ධ සමාජ දර්ශනය

– කොටියාගල උපරතන හිමි

යහපත් – අභිවෘද්ධිදායක සමාජ පරිසරයක් නිර්මාණය කිරීමට උපයෝගී වන බෞද්ධ සමාජ දර්ශනය පිළිබඳ විග්‍රහයකි. පුද්ගලයාගේ සමාජ ජීවිතය සාර්ථක වීම උදෙසා බුදු දහමෙන් ලැබෙන සමාජ විද්‍යාත්මක මඟ පෙන්වීම මතු කර දැක්වීමට දරන උත්සාහයකි.

## ⁂ සමාජ සංවර්ධනයෙහිලා භික්ෂුවගේ කාර්යභාරය

– නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි

සමාජ සංවර්ධනය විෂයෙහි බෞද්ධ භික්ෂුවගේ වගකීම් සමූහය විවිධ දූෂිත බලවේග නිසා විවිධ සමාජ පරිවර්තන ඇතිවෙමින් පවතින යගයක එම අභියෝග හමුවේ – සැබෑ අභිවෘද්ධිදායක මඟකට සමාජය ප්‍රවේශ කිරීම සඳහා භික්ෂුව තුළ තිබිය යුතු අවබෝධය මුල් කොට ගත් පෞරුෂය කෙබඳු එකක් ද යන්න ද විග්‍රහ කිරීමට ලේඛකයා උත්සාහ දරා ඇති බව පෙනේ.

## ⁂ කෝරළඉම සිල්මාතා ආශ්‍රමය

– ජනක වෙත්තසිංහ

කොළඹ – හොරණ මාර්ගයේ කෝරළ ඉම හන්දියෙන් වමට දිවෙන ‘ආවාස’ පාරේ සුන්දර පරිසරයක් තුළ පිහිටා ඇති සිල් මාතා ආශ්‍රමයක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් දැක්වේ.

## ⁂ මවුපිය අයිතිය ලැබීමට යුතුකම් ඉටු කළ යුතුයි

– කෝමාරිකේ රාහුල හිමි

මවුපිය – දූ දරු යුතුකම් හා වගකීම් පිළිබඳ විවිධ අයුරින් අඩුපාඩු හා විවේචන අසන්නට ලැබෙන යුගයක – එම සබඳතා පිරිහීමට බලපාන ප්‍රබල සාධකයක් ලෙස – මවුපියන් අතින් ඉටුවිය යුතු යුතුකම් නිසි ලෙස ඉටුවීම අත්‍යවශ්‍ය සාධකයක් බව පෙන්වා දීමටයි, මෙම ලේඛකයා උත්සාහ දරන්නේ.

### ❖ සංඛ්‍යාත්මකව සිහි තබා ගත යුතු දහම් කරුණු

– නිර්මලා අමරසිංහ

බුදු සසුන පිළිබඳ ඇතැම් වැදගත් කරුණු සහ බුදු රදුන් විසින් විවිධ ධර්ම කරුණු අවශ්‍යතාව අනුව සංඛ්‍යාත්මක වශයෙන් දක්වා ඇති ආකාරය. ත්‍රිවිද්‍යා, ත්‍රිශික්ෂා, චතුරාර්ය සත්‍ය, පංච ආනන්තර්ය කර්ම වැනි දහම් කරුණු විග්‍රහ කරන විට – ඒ තුළ දක්නට ලැබෙන වර්ගීකරණයේ බුද්ධිගෝචර බව.

### ❖ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ නා හිමි

බුදු දහම හා ඒ ඇසුරු කොටගත් විවිධ විෂය කරුණු පිළිබඳ කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සැපයෙන විශේෂාංගයකි. බෞද්ධ සිසුනට හා වැඩිහිටියනට ප්‍රයෝජනවත් විශේෂාංගයක් හැටියට මෙය හැඳින්–විය හැකි ය.

### ❖ මිනිසා විසින් මිනිසා සඳහා නිර්මාණය කළ රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය

– මිරිස්වත්තේ සුමන හිමි

අග්ගඤ්ඤ සූත්‍රය නම් වූ බුද්ධ දේශනාව තුළ දක්නට ලැබෙන රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ බුද්ධිගෝචර සාධක. බුදු රදුන් විසින් පෙන්වා වදාළ විවිධ ලෝක ධර්මතා අනුව ලොව පළමු ‘මිනිස් රාජ්‍යය’ ගොඩ නැගුණු ආකාරය.

### ❖ මළ ගිය ඇත්තන්ට පින් දීම අර්ථවත් කට යුත්තක්ද?

සංවාදයකට විවෘත වන මෙම ලිපිය පැවසෙන්නේ මළගිය අයට පින් පැමිණවීමේ චාරිත්‍රයෙහි ධර්මානුකූල බව පිළිබඳ අදහසකි.